# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,765 — 1961 නොවැම්බර් 11 වැනි සෙනසුරාද — 11.11.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරණ ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**1961 අංක 8 දරන හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝග**

1961 අංක 8 දරන හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝගයන්හි 24 වෙනි නියෝගයෙහි (10) වෙනි ඡේදයේ (අ) අනුච්ඡෙදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අග්‍රාමාත්‍ය සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක වන මම මෙහි උප ලේඛනයෙහි I වෙනි තීරයෙහි සඳහන් එක් එක් නිලධාරියා ඒ උපලේඛනයෙහි II වෙනි තීරයෙහි අනුරූප සටහනෙහි නියමිත ප්‍රදේශය සඳහා මහජන සුරක්ෂිතාවය සම්බන්ධයෙන් හෝ මහජන සාමය ආරක්ෂා කර ගැනීම සඳහා හෝ මහජන ජීවිතය සඳහා අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන වාහන බලෙන් හිමි කර ගැනීමේ කාර්යය සඳහා නිසි බලධාරියකු ලෙස මෙයින් පත් කරමි.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
**අග්‍රාමාත්‍ය.**

1961 නොවැම්බර් 11,
**කොළඹ.**

**උපලේඛනය**

| I වැනි තීරය | II වැනි තීරය |
| --- | --- |
| සම්බන්ධකා නිලධරයා | යාපනයේ පරිපාලන දිස්ත්‍රික්කය. |
| ආණ්ඩුවේ දිසාපති | වෙනත් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය. |

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

2045—ජේ. ඇන්. ආර් 20220—6,400 (61/11)